**ශීර්ෂය - 10 - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 14 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2021 ජූලි 13 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත නිකුත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ආරම්භක ශේෂ යටතේ ගැලපිය යුතු රු.3,118,800 ක් වර්ෂයේ මිලදී ගැනීම් ලෙස දක්වා තිබුණි. | **CIGAS** වැඩසටහන යටතේ මූල්‍ය නොවන වත්කම් යාවත්කාලීන කරන විට 010-1-1-0-2509 වැය විෂයය යටතේ සිදු කරන ලද ස්ථාවර වත්කම් මිලට ගැනීම් ඇතුළත් කරනු ලබන්නේ ආරම්භක ශේෂයක් ලෙසිනි. නමුත් ඒවාද මෙම වර්ෂයේ මිලදී ගැනීම් වන බැවින් එම වටිනාකමද මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ **(ACA-6)** මිලදී ගැනීම්වලට එකතු කර ඇත. | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ආරම්භක ශේෂ යටතේ ගැලපිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වත්කම් මිලදී ගැනීම් රු.9,098,376 ක් වුවද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ එය රු.9,083,576 ක් ලෙස දක්වා තිබුණි. | **CIGAS** වැඩසටහනට ඇතුළත් කිරීමේදී මෙම රු.14,800 ක මුදල 010-1-1-0-2102 වැය විෂයය යටතේ නිවැරදිව ගිණුම්ගත වී ඇතත් විශේෂ සටහන පිළියෙල කිරීමේදී එය ආරම්භක ශේෂයට ඇතුළත් කර ඇත. | සමාලෝචිත වර්ෂයේ වත්කම් මිලදී ගැනීම් නිවැරදිව ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභා ගොඩනැගිල්ල වටා තාප්පයක් ඉදි කිරීම හා නාම පුවරුවක් සවි කිරීමට වැය කළ රු.14,452,025 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2021 වසරේ ආරම්භක ශේෂ ලෙස ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඈ) | 2016 වර්ෂයේදී වැසිකිලි පද්ධතිය නවීකරණය කිරීම සහ ලේඛනාගාරයේ රාක්ක ඉදි කිරීම සඳහා රු.5,345,179 ක් වැය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී එය රු.3,713,388 ක් අඩුවෙන් රු.1,631,791 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. | 2021 වසරේ ආරම්භක ශේෂ ලෙස ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වැය කරන ලද සම්පූර්ණ වටිනාකම ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධනිත කළ කල්බදු වාහන 14 ක් සභාව වෙත පවරාගෙන නොතිබුණි. | කල්බදු කාලය අවසන් බැවින් මෙම වාහන ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කල අතර මේවා පවරා ගැනීමට අදාලව අපගේ ප්‍රමාදයක් නොමැති අතර දැනටමත් පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | අයිතිය පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවලට වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ප්‍රාග්ධනිත කර තිබූ වාහන 22 ක පිරිවැය ප්‍රාග්ධනිත කිරීම වෙනුවට රක්ෂණය කිරීම සඳහා නිශ්චය කල වටිනාකම ප්‍රාග්ධනිත කර තිබුණි. | වාහන 22 රක්ෂණය කර ඇත්තේ එහි පිරිවැයටම වන බැවින් ඒ අගයම ප්‍රාග්ධනිත කර ඇත. | පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතුය. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ විශේෂ සටහන 02 අනුව අවසාන මුදල් ශේෂය රු.45,000 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ශේෂයක් දක්වා නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල්වල ශුද්ධ වෙනස්වීම පමණක් සලකා වසර අවසාන උප අග්‍රිම ශේෂය විශේෂ සටහන් 2 යටතේ දක්වා ඇත. | නිවැරදිව සටහන් කළ යුතු වීම. |

1.6.3 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ අවසානයේ වියදම හා ලැබීම් පිළිවෙලින් රු.12,274,732 ක් හා රු.7,432,579 ක් වුවත් මු.රෙ 506 (ඕ) ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි එම ශේෂයන් පිළිවෙලින් රු.12,035,375 හා රු.7,193,221 ක් ලෙස දක්වා තිබුණි. | මෙය 2021 වර්ෂයේ සිට පිළියෙල කරනු ලබන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි වාර්ෂික සැසඳුම් ප්‍රකාශ සඳහා යොදා ගනු ලැබේ. | වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ වර්ෂ අවසානයේ වියදම හා ලැබීම්හි තත්‍ය අගයන් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත පරිදි දැක්විය යුතු වීම. |

**1.6.4** **වාණිජ නොවන අත්තිකාරම් ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට රු.2,597,130 ක වැටලීම් අත්තිකාරම් වලට අදාල නඩු තීන්දු ප්‍රකාශයට පත් කර තිබුණද, 2021 මාර්තු 30 දින වන විටද එම ශේෂ නිරවුල් කර නොතිබුණි. | රු.2,597,130 වැටලීම් අත්තිකාරම් මුදල්වලට අදාල නඩු ගොනු දැනට නිරවුල් කිරීමට අදාල කටයුතු කරමින් තිබේ. | අල්ලස් වශයෙන් පරිහරණය සඳහා ලබාදෙන අත්තිකාරම්, නඩු භාණ්ඩ නිලධාරියා භාරයේ හෝ එම නඩු අවසන් වී නඩු තීන්දු ප්‍රකාශයට පත් කරන තෙක් රඳවාගෙන, පසුව සරප් වෙත නිරවුල් කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ __ මුදල් රෙගුලාසි (2) 371 | කාර්යය නිමවූ විගස තත්කාර්ය අතුරු අග්‍රිම පියවිය යුතු වුවද අවස්ථා 09 කදී ලබාදී තිබුණු රු.74,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම මාස 02 සිට මාස 04 දක්වා ප්‍රමාද වී පියවා තිබුණි. | ප්‍රමාදය සිදුවූයේ කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් නිලධාරින් කඩින්කඩ කැඳවීම නිසා සහ ඔවුන්ගේ විමර්ශන හා නඩු වලට අදාල ගොනුවල කටයුතු ගොඩ ගැසීම නිසා කාර්ය බහුල වීම හේතුවෙනි. | මුදල් රෙගුලාසි )3712( ප්‍රකාරව අතුරු අග්‍රිම පියවිය යුතුය. |
| **(ආ)** 2016 මාර්තු 31 දිනැති අංක 2016/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය | (i) පොදු 47 වාර්තාව යටතේ දක්වා තිබුණු භාණ්ඩ සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයේදී ලබාදී තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් මෙම තත්වය ඇතිවූ අතර,මේ වනවිට අබලි භාණ්ඩ වෙන්දේසිය පවත්වා අපහරණ කටයුතු සිදුකර ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 2019 දෙසැම්බර් 31 දිනට නඩු භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | නිලධාරීන් කඩින්කඩ සේවයට කැඳවීම හේතුවෙන් ඇතිවූ කාර්ය බහුලත්වය නිසා මෙසේ අමතර කටයුත්ත සඳහා නිලධාරීන් යෙදවීමේ හැකියාව නොමැති විය. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරිම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | නිරීක්ෂණ මඟින් පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අදාල සියලු ලේඛනද ඇතුළත්ව සකස් කරනු ලැබේ. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඇස්තමේන්තුගත වටිනාකම රු.1,136,818 ක් වූ පස්මහල් ගොඩනැගිල්ලේ බිම් මහලේ වැසිකිලි පද්ධතිය නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරා තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) වගන්තිය ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි. ඒ හේතුවෙන් කොන්ත්‍රාත් කාලය හඳුනා ගැනීමට නොහැකි වී තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(අ) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදනයේ මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වූයේද යන්න තහවුරු කර ගැනීමට ද නොහැකි විය. | මෙම කොමිෂන් සභාවේ සිවිල් ඉංජිනේරුමය දැනුම ඇති නිලධාරියකු නොමැති බැවින් බොහෝ ඉදිකිරීම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හරහා සිදු කරයි. ඔවුන් විසින් කරනු ලබන කල වැඩ සහතික කිරීමේ පදනමින් ගෙවීම් අනුමත කරනු ලබයි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) හා 1.2.(අ) වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වසර 10 කට අධික කාලයක් සිට පැවත එන සිද්ධි 02 කට අදාල රු.34,954 ක පාඩු සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද නොහැකි වී තිබුණි. | මෙම අලාභ බොහෝ කාලයකට ඉහත සිදුවූ අනතුරු නිසා ඇති වූ අලාභයන් වේ. ඉදිරියේදී මේ සම්බන්ධයෙන් සොයා බලා පොත්වලින් කපා හැරීමට කටයුතු කරනු ඇත. | මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) නඩු තීන්දු ලබා දී වර්ෂ ගණනාවක් ගත වුවද ඇතැම් ගොනු වලට අදාල නඩු භාණ්ඩ, නඩු භාණ්ඩ නිලධාරියා භාරයේ පැවතුණි. | නඩු භාණ්ඩ අධිකරණය භාරයේ ඇති බැවින් ඒවා කොමිෂන් සභාවට ගෙන්වා ගෙන අනතුරුව අපහරණ කමිටුවක් පත්කොට එමඟින් ලබා දෙන නිර්දේශ මත කටයුතු කිරීමෙන් පසු අත්තිකාරම් මුදල් පොතෙන් කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | අධිකරණමය කටයුතුවලින් පසු නඩු තීන්දුව ලැබීමෙන් අනතුරුව හෝ අභියාචන අවසන් වීමෙන් අනතුරුව එම ගොනුවලට අදාලව නඩු භාණ්ඩ නිලධාරීයාගේ භාණ්ඩ ශේෂය තුළ පවතින භාණ්ඩ පොත්වලින් ඉවත් කළ යුතුය. |
| (ආ) 2016 මාර්තු 01 දින පැවති ආර්ථික කළමණාකරන අමාත්‍ය මණ්ඩල කමිටුව මඟින් අංක 36/69/සී දරන මලලසේකර මාවතේ පිහිටි භූමිය කොමිෂන් සභාව වෙත පවරා දීමට 2016 වර්ෂයේදී තීරණය වී තිබුණද එහි නිත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට 2020 දෙසැම්බර් අවසාන දින වනවිටත් නොහැකි වී තිබුණි. | දැනට මෙම භූමියේ නිත්‍යානුකූල අයිතිය ඇත්තේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම්ට වන අතර මෙය කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට ඉල්ලීම් කර ඇති අතර ප්‍රාදේශීය ලේකම්ගේ එකඟතාව ලද පසු කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | භූමියේ නිත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට සිවිල් කාර්යමණ්ඩල පුරප්පාඩු 425 ක් හා විමර්ශන අංශ කාර්යමණ්ඩල පුරප්පාඩු 44 ක් පැවතුණි. | කොමිෂන් සභාවේ පවතින සීමිත ඉඩකඩ ප්‍රමාණය නිසා නව බඳවා ගැනීම් සිදු කිරීමටද අපහසු වී ඇත. නමුත් 2021.03.01 දින දූෂණ නිවාරණ නිලධාරීන් 18 දෙනෙක් හා 2020.10.15 දින නීති සහකාර නිලධාරීන් 11 දෙනෙකුද 2021.02.25 දිනැතිව නීති සහකාර නිලධාරී 03 බඳවා ගැනීමට කටයුතු කර ඇත. විමර්ශන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 44 න් 42 ක් මේ වන විට සම්පූර්ණ කර ඇත. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා පුරප්පාඩු, නිසිපරිදි පිරවීමට කටයුතු කළ යුතුය. |